


**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email - sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දැන්වන වග

### අර්ථවත් වෙසඟක් වෙනුවෙන් පැතුමක්

බුදු දහම මේසා විකෘතියකට ලක් වූ කාල වකවානුවක් ඉතිහාසයේ කිසි දාක තිබී නැත. වදනින් පෙනුමින් සියල්ලෝම සැබෑ බෞද්ධයෝ වෙති. පන්සල් යති. මල් පහන් පූජා කරති. ගාථා කියති. බෝධි පූජා පවත්වති. එහෙත් බුදු දහමේ කියැවෙන සැබෑ සංකල්ප වටහා ගත් සැබෑ බෞද්ධ ප්‍රතිපත්ති අනුගමනය කරන අය සොයා ගැනීම කෙතරම් අපහසු ද? සියල්ලෝම ආමිස පූජා පවත්වන්නට පෙරහැරේ යන නමුත් ප්‍රතිපත්ති පූජාවේදී සැඟවෙති. "මම බෞද්ධයෙක්මි"යි ලොවට පෙන්වා දෙන්නට මහන්සි වෙන පිරිස අතරේ සැඟව ගිය සැබෑ බෞද්ධයා සුසුම් හෙළයි.

ගිහියන් පසකෙ තබමු. අද සංඝ සභාවට වී ඇක කලබැගෑනිය දකින්නෙක් නැද්ද? මැද ඇඟිල්ල ඔසොවා පෙන්වන සිවුරු දරාගත් මැරයන් දකින විට "අනේ බුදු සසුනට ගිය කලක්2 යයි සැබෑ බෞද්ධයෝ කම්පා වෙති. ජාතිවාදය අවුලුවමින් රට ගිනි තබන්නට කැසකවන සඟුන් යයි කියාගන්නා අය දකින විට ඇතිවන කම්පාව මෙතෙකැයි කියා කිව හැකිද? සංඝ නායක වහන්සේලා සැපසේ ඇස්කන් පියාගෙන සිටිති. ගෝල බාලයන්ට උප-දෙසක්වත් දෙන්නට උන්වහන්සේලාගේ ශ්‍රී මුඛ ඇරෙන්නේම නැත.

තවත් වෙසක් උත්සවයක් පැමිණ ඇත්තේ මේ ව්‍යසනය මැද්දේය. සමානාත්මතාව සහජීවිනය අහිංසාවම දේශනා කළ බුදුන් වහන්සේ ගේ තෙමඟුල සැමරෙන මේ වෙසඟේදීවත් එලදායි ප්‍රාර්ථනාවක් සිත්හි ධාරණය කර ගනිමු. ප්‍රදර්ශනාත්මක බුදු දහම නොව සැබෑ බුදු දහම සොයා යමු.

**මිථ්‍යාවෙන් වෙන්වී සියලු සිත් පහන් වන වෙසඟක් වේවා**



# කුමාර් ගුනරත්නම්, දේශපාලන අරගල හා නීතිය

**අජිත් පැරකුම් ජයසිංහ**

කුමාර් ගුනරත්නම් සිද්ධිය විසින් වැදගත් දේශපාලන සංවාදයක් මතු කර තිබේ. එම සංවාදය මතු වන ප්‍රධාන තල දෙකක් තිබේ. එකක් නීතිමය තලයයි. අනෙක වාම දේශපාලන තලයයි. වඩාත් ම ප්‍රතිපක්ෂ වන්නේ මේ තල දෙක අතර ඇති වන සංවාදයයි.

නීතිමය තලය නිරූපණය කිරීම සඳහා ගාමිනී ඒකනායක විසින් සමාජ ජාල හරහා මතු කරන ලද මෙම අදහස් දැක්වීම සැලකිය හැකි ය.

**මෙතන ගැටළුවක් තියෙනවා. කුමාර් ගුනරත්නම් ඕස්ට්‍රලියාවට පැනගියේ ජීවිත ආරක්ෂාවට කියමුකො. එහෙනං එයා ඉන්න ඇත්තේ** refugee visa **යටතේ වෙන්න ඕනෙන. අනිත් පැත්තෙන් තියෙන කතාවට අනුව එයා ගියේ බිරිඳගේ** sponsorship **හරි** family reunion **වැනි පදනමකට නං එයාට උපරිම ලැබෙන්නේ** permanent resident visa **නෙ. ඒ ඩසී එකේ පැහැදිලිවම සඳහන්වෙනවා ඉන්න පුලුවන් කාලය** indefinite **කියල. ඒක දෙන්නෙත්** multiple entry **වලට. එහෙමනම් ඇයි එයා** citizenship apply **කලේ. නිකම්ම ඕස්ට්‍රලියානු රජය අනේ මේක ගන්නම** please **කියල** citizenship **දෙන්නෙ නැහැ. නියමිත නීත්‍යානුකූල ක්‍රියාවලියක් සම්පූර්න කිරීමෙන් පසුව ඕස්ට්‍රලියානු රජයේ** citizenship ceremony **යකදී ප්‍රසිද්ධියේ දිවුරුම්දීලයි** citizenship **සහතිකය ලැබෙන්නෙ. එදා හිතුනෙ නැද්ද මෙයින් "මම දේශපාලනය කල රට මෙයින් ඇත්හැරෙනවා" කියලා. ඒකත් අතාරිමුකො. හොඳයි ඇයි නියමිත** duel citizen **පටිපාටියෙන් නීත්‍යානුකූලව අයදුම් නොකලේ. පසුගිය රජය යටතේ ඔහු අතිවිශාල ගැටලූවකට මුහුනදුන් වෙලේ මෙලෙස පෙරටු ගාමීනුයි මේ උගත්තු කියන කට්ටියයි මේ ආකාරයෙන්ම පෙනී නොසිටියේ ඇයි? එදා පෙනී සිටියේ ඕස්ට්‍රලියානු තානාපති කාර්යාලය පමනයි. ඒ වගේම තව බොහෝ දෙනෙක් ඉන්නවා** duel citizenship **ගන්න බලාගෙන. එයාලත් මේ ක්‍රමයටම වීසා නීති කඩා ගෙන දේවල් කරන්න උත්සාහ කලොත් මේ ඔබලා හැමෝම මේ විධියටම ඒ අය වෙනුවෙනුත් පෙනී සිටිනවාද? අවුරුදු දෙකතුනකට කලින් ඇති වුනු ප්‍රශ්නයේදී ඕස්ට්‍රලියානු තානාපති කාර්යාලයත් මැදහත් වෙලා බේරිලා ගිය කුමාර් ගුනරත්නම් ජනාධිපතිවරන සමයේදී** visitor visa **එකෙන් ඉතා සැහැල්ලුව ආපසු ඇවිල්ලා දේශපාලනයත් කලේ කොහොමද? ජනාධිපතිවරන සමයේදී එය සංවිධානයකල කෙනාගේ සෙවනැල්ලම මේ නීති කඩා බිඳ දමමින් කරන්නට හදන ව්‍යාපාරය පසුපස තියෙනවා වත්ද?**

8 වන පිටට